**කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2020**

කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග, මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉහල සංචලතා සම්බන්ධකයක් ලෙස කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් වාහන තදබදය අවම කිරීම හා විසුරුවා හැරීම මෙන්ම එමඟින් කොළඹ නගරයේ ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම හා ආර්ථික සංවර්ධනය දිරිගැන්වීම සඳහා දායකවීම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ණය ගිවිසුම අනුව ව්‍යාපෘතිය යකඩ පාලම් අංශය (Steel Bridge Section) සහ අමතර මාත්‍රා අංශය (Extra Dosed Section) ලෙස වෙන් කර ඇති අතර, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 55,313 කට සමාන ජපන් යෙන් මිලියන 41,429 ක් වන අතර ඉන් රු.මිලියන 46,755 කට සමාන ජපන් යෙන් මිලියන 35,020 ක් ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 8,558 ක වටිනාකම ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය කාණ්ඩ දෙකෙහි වැඩ කටයුතු 2014 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර පිළිවෙලින් 2021 මාර්තු 27 සහ 2021 මාර්තු 28 නිම කිරීමට නියමිතය.

## 1.3 මතය.

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

## 2. භෞතික කාර්යසාධනය.

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය.

| ව්‍යාපෘති කොටස් | ක්‍රියාකාරකම් | 2020 දෙසැම්බර් 31 දිනට | | විගණන ගැටළුව | ප්‍රමාද වීමට බලපෑ හේතු. |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස | ළඟා කරගත් කාර්යසාධනය ප්‍රතිශතයක් ලෙස | | |
| පැකේජ II | අමතර මන්ත්‍රා කොටස | 94 | 84 | ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යසාධනය සාක්ෂාත් කර ගැනීමට නොහැකිව තිබූ අතර අපේක්ෂිත කාර්යසාධනයෙන් සියයට 10 ක අපගමනයක් සිදු වී තිබුණි. | 2020 මාර්තු මස පැවති කොවිඩ් 19 වසංගත කක්වය බලපෑම |

### 2.2 කොන්ත්‍රාත් පරිපාලනය.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ ප්‍රතිචාර | විගණකයාගේ නිර්දේශ |
| --- | --- | --- |
| 2021 අප්‍රේල් 30 පසුවත් කොන්ත්‍රාත්තු කාලය දීර්ඝ කිරීමක් ලබා නොගෙන කොන්ත්‍රාත්තුව දිගටම සිදු කරගෙන ගොස් තිබූ බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් ඉංජිනේරුවරයා විසින් නිකුත් කරනු ලබන තීරණ පදනම් කරගෙන කොන්ත්‍රාත් දෙකටම අදාළව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම වරින් වර ලබා දෙනු ලැබේ. ඉංජිනේරුවරයා විසින් නිකුත් කරනු ලද කෙටුම්පත් තීරණය, මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කළ තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ඇගයීම්කර සභාපති විසින් අනුමත කරනු ලැබේ. | කොන්ත්‍රාත් ලේඛන වලට අනුව නීතිමය බැඳීම් ඉටු කිරීමට පෙර අවශ්‍ය කාලය තුළ දීර්ඝ කිරීම අනුමත කර ගත යුතුය. |

### 2.3 මතභේදාත්මක ස්වරූපයේ කරුණු.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ ප්‍රතිචාර | විගණකයාගේ නිර්දේශ |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය නැවත ප්‍රතිස්ථාපනය කිරීමට වෙනුවෙන් හල්බරාව ප්‍රදේශයේ ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 34 ක මුදලක් වියදම් කර තිබූ අතර, ඇති වූ මහජන විරෝධතා නිසා 2015 ජූනි 17 දින ඉදිකිරීම නවතා දැමීමට සිදුවිය. පසුව මෙම පරිශ්‍රය ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) වෙත භාර දී තිබුණි. මේ අනුව දරන ලද වියදම අනාර්ථික වියදමක් ලෙසට නිරීක්ෂණය කෙරේ. | රු. මිලියන 34 ක කොන්ක්‍රීට් අත්තිකාරම් වැනි ස්ථිර වැඩ වල වටිනාකම හල්බරාව වැඩ බිමේ සිදුකර ඇත. ස්ථිර වැඩ සහිත ඉඩම ඔවුන්ගේ අනාගත වැඩ සටහන් සඳහා භාවිතා කිරීම සඳහා ජාතික ආධුනිකත්ව හා පුහුණු අධිකාරිය (NAITA) වෙත භාර දෙන ලදි. එම නිසා වියදම් කළ මුදල අනාර්ථික වියදමක් ලෙස සැලකිය නොහැකිය. | මෙම ශේෂය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ගිණුම්වල වෙනම කොටසක් ලෙස දැක්වීමටත් මාර්ග සංවර්ධන අධිකාරියට ව්‍යාපෘතියෙන් මාරු කරන ලද වත්කම් වටිනාකම් වලින් ලියා හැරීමටත් පියවර ගත යුතුය. |